# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,147 — 1957 ජූලි 20 වැනි සෙනසුරාදා — 20.7.1957

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජී. ජී. ඕ. අංකය: ඕ. 375/52.

ලංකාවේ සිටින ජපන් ආණ්ඩුවේ අති විශෙෂ හා පූර්ණබල තානාපති ලෙස අකිරා මැට්සුයි උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්තේය.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,
ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාණන්ගේ ලේකම්.

1957 ජූලි 19 වැනි දින,
අග්‍රාණ්ඩුකාරතුමාණන්ගේ කායර්‍යාලය, කොළඹ 1.

---

**1950 අංක 25 දරණ ආහාර පාලන ආඥාපණත**

**අංක 71 දරණ නියෝගය**

1950 අංක 25 දරණ ආහාර පාලන ආඥා පණතේ 4 (1) (i) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දෙන් ෆිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, මෙම නියෝගයෙන්—

(1) යමෙකු විසින් ගෙනයනු ලබන රාත්තල් 7 ක ප්‍රමාණයක් හැර, රතුලූණු හෝ බෙලරි ලූණු කොයි යම් ප්‍රමාණයක් වත් යාපනේ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක තැනගේ බල පත්‍රයක් නැතිව—

(අ) යාපනේ අර්ධද්වීප කලපුවේ වෙරළේ හෝ මුහුද වට යම් ස්ථානයකින්, ඔරුවකින් හෝ රුවල් යාත්‍රාවකින් ;

(ආ) යාපනේ අර්ධද්වීපයෙන් ;

ගෙන යෑම හෝ ප්‍රවාහණය කිරීම තහනම් කරමි.

මේ නියෝගය සඳහා "යාපනේ අර්ධද්වීපය" නමින් හැඟවෙන්නේ පූනකරි-තුනුක්කයි ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය සහ පච්චිලයිප්පල්ලෙයි-කරච්චි ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කරච්චි කොටසද, පච්චිලයිප්පල්ලෙයි-කරච්චි ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කොවිල්වායල් සහ මුල්ලියන් යන ගම්මුළාදැනි වසම්ද, තෙනමරච්චි ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ තනන්කිලප්පු යන ගම්මුළාදැනි වසම ද ඇතුළත්ව යාපනේ ආදායම් දිස්ත්‍රික්කයයි.

(2) 1957 මැයි 29 වැනි දින, අංක 11,120 සහ 1957 ජූනි 25 වැනි දින, අංක 11,135 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රවල පළකර තිබෙන අංක 68 සහ 70 දරණ මගේ නියෝග මෙයින් අවලංගු කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1957 ජූලි 19 වැනි දින
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, කොළඹ.

2359—J. N. B 18428—3,968 (7/57)